JMC vLearning
"your virtual learning partner"

# ගිණුම්කරණ සමීකරණ, ද්විත්ව සටහන් න්‍යාය සහ ගිණුම්කරණ සංකල්ප 02 කොටස

## AAT අදියර I

FAC - මූල්‍ය ගිණුම්කරණය


**සංදීප ජයසේකර**

MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Visiting Lecturer – Colombo University



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd

Pioneers in Professional Education

65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917



ද්විත්ව සටහන් න්‍යාය
Sandeepa Jayasekera - JMC
1




ලූකා පැසියෝලි
ගිණුම්කරණයේ පියා

1494 දී ලූකා පැසියෝලි ද්විත්ව සටහන් න්‍යාය හදුන්වා දෙන ලදි.
සෑම ගනුදෙනුවකම තිබෙන ද්විත්ව බලපෑම හර සහ බැර ලෙස ලෙජරය තුල වාර්තා කිරීම මෙම න්‍යාය තුලින් අදහස් වේ.



## ගනුදෙනුවල ද්විත්ව බලපෑමට උදාහරණ

| | |
|---|---|
| රුපියල් මිලියන 5ක් වැය කර මෝටර් රථයක් මිලදී ගැනීම | • රුපියල් මිලියන 5 ක මෝටර් රථ වත්කම් වැඩි වේ<br>• රුපියල් මිලියන 5 ක මුදල් වත්කම් අඩු වේ |
| රුපියල් මිලියන 10 ක බැංකු ණයක් ලබා ගැනීම | • රුපියල් මිලියන 10 ක මුදල් වත්කම් වැඩි වේ<br>• රුපියල් මිලියන 10ක ණය වගකීම් වැඩි වේ |
| රුපියල් මිලියන 2 ක අලෙවිකරණ වියදමක් දැරීම | • රුපියල් මිලියන 2 ක වියදම් අලෙවිකරණ වැඩිවේ<br>• රුපියල් මිලියන 2 ක මුදල් වත්කම් අඩු වේ |

# ද්විත්ව සටහන් න්‍යාය

ලූකා පැසියෝලි හදුන්වා දුන්න ද්විත්ව සටහන් න්‍යායට අනුව සෑම ගණුදෙනුවක ද්විත්ව බලපෑම හර සහ බැර විදිහට අපි වාර්තා කරනවා. ඒ අනුව සෑම මොහොතකම හර එකතුව බැර එකතුවට සමාන වෙනවා. මේ ක්‍රමවේදය විස්තරාත්මක ගිණුම්කරණ සමීකරණයට සම්බන්ධ වෙනවා.

වත්කම් සහ වියදම් හර ශේෂයක් විදිහටත් හිමිකම්, ආදායම්, වගකීම් බැර ශේෂයක් විදිහටත් අපි සළකනවා. වත්කම් වියදම් තියන හර ශේෂවල වැඩිවීම හර විදිහටත් අඩුවීම බැර විදිහටත් අපි සටහන් කරනවා. හිමිකම් ආදායම් වගකීම් කියන බැර ශේෂ වැඩිවීම බැර විදිහටත් අඩුවීම හර විදිහටත් අපි වාර්තා කරනවා. සෑමවෙලේම හර එකතුව බැර එකතුවට සමාන වෙන නිසා වරදක් තිබුණත් ඒක හදුනාගන්න පහසු වෙනවා.



JMC vLearning "your virtual learning partner"

# විස්තරාත්මක ගිණුම්කරණ සමීකරණයට සහ ද්විත්ව සටහන් න්‍යාය

**හර = බැර**

**වත්කම් + වියදම් = හිමිකම් + ආදායම + වගකීම**

**වැරදි අනාවරණය වන නීතිය**

# ද්විත්ව සටහන් න්‍යාය

| මූලිකාංගය | වැඩිවීම | අඩුවීම |
|---|---|---|
| වත්කම් | හර | බැර |
| වියදම් | හර | බැර |
| හිමිකම් | බැර | හර |
| ආදායම් | බැර | හර |
| වගකීම් | බැර | හර |

7

# ප්‍රශ්න 01

පහත සිදුවීම හර ද බැර ද යන්න සඳහන් කරන්න.

| සිදුවීම | හර | බැර |
|---|---|---|
| වත්කමක වැඩිවීම | | |
| වගකීමක අඩුවීම | | |
| වියදමක වැඩිවීම | | |
| ආදායමක අඩුවීම | | |
| හිමිකමක වැඩිවීම | | |
| වත්කමක අඩුවීම | | |
| වගකීමක වැඩිවීම | | |
| වියදමක අඩුවීම | | |
| ආදායමක වැඩිවීම | | |
| හිමිකමක අඩුවීම | | |

# තොග ගිණුම් තැබීම ගැන විශේෂ සටහන



- ගිණුම්කරණ සමීකරණය තුල අප තොගය වත්කමක් ලෙස සළකයි. එම නිසා තොග මිල දී ගැනීමකදී තොග වැඩි වීම තොග වත්කම වැඩිවීමක් සේ සළකයි. විකුණුමකදී, විකුණන ලද තොගයේ පිරිවැය තොග වත්කමෙන් අඩු කරයි.
- එහෙත් ද්විත්ව සටහන් න්‍යායේදී තොග මිල දී ගැනුම, තොග වත්කමට නොව ගැනුම් වියදමක් සේ සළකයි. විකුණුමකදී විකුණුම් ආදායම ගිණුම් ගත කරන අතර විකුණු තොගයේ පිරිවැය ගැලපීමක් නොකරයි. වසර අවසානයේ අවසාන තොග ගැලපීම තුලින් විකුණන ලද තොගයේ පිරිවැය මූල්‍ය ප්‍රකාශ තුල හඳුනාගනී

JMC vLearning
"your virtual learning

## ප්‍රශ්න 02

**පහත අයිතමවල ස්වභාවය හර ද බැර ද යන්න සඳහන් කරන්න.**

| | | | |
|---|---|---|---|
| අතැති මුදල | | බැංකු ණය | |
| බැංකු මුදල | | ණයගැතියන් | |
| බැංකු අයිරාව | | ප්‍රචාරණ වියදම | |
| ලද වට්ටම් | | ප්‍රාග්ධනය | |
| දුන් වට්ටම් | | ලද කොමිස් | |
| ගැණුම් | | මෝටර් රථය | |
| ණයහිමියන් | | විදුලිය වියදම | |
| බැංකු ගාස්තු | | විකුණුම් ආදායම | |

# ප්‍රශ්න 03

**පහත ගණුදෙනුවල ද්විත්ව සටහන සඳහන් කරන්න.**

| ගනුදෙනුව | හර කරන ගිණුම | බැර කරන ගිණුම |
| --- | --- | --- |
| අයිතිකරු මුදලින් යෙදවූ ප්‍රාග්ධනය | | |
| අත්පිට මුදලට විකුණුම් | | |
| ණයට විකුණුම් | | |
| අත්පිට ගැනුම් | | |
| ණයට ගැනුම් | | |
| ණයගැතියන්ගෙන් ලද මුදල් | | |
| ණයහිමියන්ට ගෙවූ මුදල් | | |
| ගෙවූ වැටුප් | | |
| ගෙවිය යුතු වැටුප් | | |

| ගනුදෙනුව | හර කරන ගිණුම | බැර කරන ගිණුම |
| --- | --- | --- |
| බැංකු ණය ලැබීම් | | |
| බැංකු ණය ගෙවීම් | | |
| යන්ත්‍රයක් මිලට ගත්තා | | |
| යන්ත්‍රයක් ණයට ගත්තා | | |
| කොමිස් ආදායම් ලැබුණා | | |
| කොමිස් ආදායම් ලැබිය යුතුයි | | |
| අයිතිකරු මුදලින් කළ ගැනිලි | | |
| අයිතිකරු කළ භාණ්ඩ ගැනිලි | | |
| ඉදිරි වර්ෂය සඳහා ගෙවූ වරිපනම් | | |
| ණයගැතියන්ට දුන් වට්ටම | | |
| ණයහිමියන්ගෙන් ලද වට්ටම | | |

JMC vLearning "your virtual learning partner"

# ලෙජර් ගිණුම

ලෙජරය කියන්නේ භෞතිකව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් තුල පවත්වාගෙන යන ගිණුම් එකතුවකට. ගිණුම්කරණයේදී අපි ගණුදෙනුවල ද්විත්ව බලපෑම හර සහ බැර විදිහට වාර්තා කරන්නේ ලෙජරයක. ලෙජර ගිණුමක T අකුරක ආකෘතිය භාවිතා කරනවා.




JMC vLearning
"your virtual learning partner"

# ලෙජර් ගිණුම වර්ගීකරණය



## 2019 ජනවාරි ප්‍රශ්න අංක 1.14

පහත සඳහන් එක් එක් ප්‍රකාශය සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න

a) නාමික ගිණුම්වල ව්‍යාපාරයේ වියදම් සහ ආදායම් ගිණුම් අඩංගු වේ

b) ණය පදනම මත කාර්යාල පරිහරණය සඳහා රුපියල් 100,000/- කට පරිගණකයක් මිලදී ගැනීම බලපාන්නේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ඇති වත්කම්වලට පමණි.



JMC vLearning "your virtual learning partner"

## 2019 ජූලි ප්‍රශ්න අංක 1.6

ගිණුම්වල සම්ප්‍රදායික වර්ගීකරණය යටතේ නාමික ගිණුමක් සඳහා උදාහරණයක් වේ

(1) ගොඩනැගිලි ගිණුම. (2) මෝටර් වාහන ගිණුම

(3) බැංකු ණය ගිණුම. (4) විකුණුම් ගිණුම.

# 2020 ජනවාරි ප්‍රශ්න අංක 1.6

**සාම්ප්‍රදායික ගිණුම් වර්ගීකරණය යටතේ මූර්ත ගිණුමක් සඳහා උදාහරණයක් වන්නේ පහත ඒවායින් කවරක් ද?**

(1) **ණය ගැතියන්ගේ ගිණුම**

(2) **විකුණුම් ගිණුම**

(3) **ණය පොළී ගිණුම**

(4) **යන්ත්‍රෝපකරණ ගිණුම**



vLearning "your learning partner"



# ලෙජර් ගිණුමක ආකෘතිය

| හර පැත්ත | | | | ගිණුමේ නම | | බැර පැත්ත | |
|---|---|---|---|---|---|---|---|
| දිනය (1) | විස්තරය (2) | සඟල පිටුව (3) | වටිනාකම (4) | දිනය (1) | විස්තරය (2) | සඟල පිටුව (3) | වටිනාකම (4) |
| | | | | | | | |
| | | | | | | | |

| | |
|---|---|
| (1) දිනය | ගණුදෙනුව සිදු වූ දිනය |
| (2) විස්තරය | ගණුදෙනුවේ අනිත් සටහන වාර්තා කළ ගිණුමේ නම |
| (3) සඟල පිටුව | ගණුදෙනුවේ අනිත් සටහන් වාර්තා කළ ලෙජරයේ ගිණුම් අංකය |
| (4) වටිනාකම | ගණුදෙනුවේ වටිනාකම |

# ලෙජර් ගිණුම්වල ගනුදෙනු වාර්තා කිරීම

| | |
|---|---|
| පියවර 01 මූලිකාංග | ගණුදෙනුව බලපාන ගිණුම්කරණ මූලිකාංග (වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් සහ වියදම්) හදුනාගන්න. |
| පියවර 02 +/- | ගණුදෙනුව නිසා ගිණුම්කරණ මූලිකාංගය වැඩිවන්නේ ද, අඩුවන්නේද යන්න තීරණය කරන්න. |
| පියවර 03 හර බැර | ද්විත්ව සටහන් න්‍යාය භාවිතා කර හර සහ බැර සටහන තීරණය කරන්න. |
| පියවර 04 වටිනාකම | අදාළ ලෙජර් ගිණුම් වෙත ගොස් හර වන ලෙජරයේ හර පැත්තේ අදාල වටිනාකම ද බැර වන ලෙජරයේ බැර පැත්තේ අදාල වටිනාකම ද සටහන් කරන්න. |
| පියවර 05 විස්තරය | විස්තර තීරුව තුල ලෙජර ගිණුම් දෙකේ නම් මාරුකර සටහන් කරන්න. |

# ජනවාරි 01 දින මුදලට විකුණුම් රු 10,000

| | |
|---|---|
| පියවර 01<br>මූලිකාංග | මුදල් වත්කම<br>විකුණුම් ආදායම |
| පියවර 02<br>+/- | මුදල් වැඩිවේ.<br>විකුණුම් වැඩි වේ. |
| පියවර 03<br>හර බැර | මුදල් වැඩිවේ.<br>විකුණුම් වැඩි වේ. |

**මුදල්**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1/1 | විකුණුම් | 10,000 | | | |

**විකුණුම්**

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 1/1 | මුදල් | 10,000 |

JMC vLearning
your virtual learning partner

# ප්‍රශ්න 04

පහත ගනුදෙනුවල ද්විත්ව සටහන ලියා ලෙජර් ගිණුම් තුල ඇතුලත් කරන්න

| විස්තරය | හර | බැර |
|---|---|---|
| 1. මනුක රු. 500,000 ක් ආයෝජනය කරමින් ව්‍යාපාරය ආරම්භ කරන ලදි. | | |
| 2. ව්‍යාපාරය විසින් රු. 300,000 ක් වටිනා තොග මිලදි ගන්නා ලදි. | | |
| 3. කාර්යාලයේ භාවිතය සඳහා රු. 50,000ක උපකරණ මිලදි ගන්නා ලදි. | | |
| 4. ලද කුලී ආදායම රු. 5,000 කි. | | |
| 5. රු. 700,000 ක අයිතම ණය පදනම මත මිලදි ගන්නා ලදි. | | |
| 6. රු. 50,000 ක් පිරිවැය වූ තොගයක් රු. 75,000 කට විකුණන ලදි. | | |
| 7. රු. 400,000 ක බැංකු ණයක් ලබා ගන්නා ලදි | | |
| 8. රු. 100,000 ක් පිරිවැය වූ තොගයක් රු. 250,000 ණයට විකුණන ලදි. | | |
| 9. රු. 50,000 ක ස්ථාවර තැන්පතුවක් විවෘත කරන ලදි. | | |

| විස්තරය | හර | බැර |
|---|---|---|
| 10. මනුක විසින් රු. 10,000 ක මුදලක් ගැනිලි සිදු කරන ලදි | | |
| 11. මනුක විසින් රු. 20,000 පිරිවැය වූ තොග තම පෞද්ගලික ප්‍රයෝජනයට ලබා ගන්නා ලදි. | | |
| 12. මනුක විසින් රු. 200,000 ක අතිරේක ප්‍රාග්ධනයක් ව්‍යාපාරයට ආයෝජනය කරන ලදි. | | |
| 13. සේවකයින් වෙත රු. 50,000 ක වැටුප් ගෙවන ලදි. | | |
| 14. මාසයේ විදුලි බිල රු. 5,000 තවමත් ගෙවා නොමැත. | | |
| 15. රු. 15,000 ක් වූ බැංකු ණය වාරිකය ගෙවා දමන ලදි. වාරිකයෙන් රු. 2,000 ක් පොළිය වේ. | | |
| 16. ස්ථාවර තැන්පතුවෙන් ලද පොලී ආදායම රු. 1,000 කි. | | |
| 17. ණයහිමියන්ට රු. 20,000 ක් ගෙවන ලදි. | | |
| 18. ණයගැතියන්ගෙන් ලද මුදල රු. 30,000 කි. | | |

# 2019 ජුලි ප්‍රශ්න අංක 1.15

පොත් සාප්පුවක පහත සඳහන් එක් එක් ගනුදෙනු සඳහා නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න:

අ) මාර්තු මාසය සඳහා ගෙවිය යුතු විදුලිය රු. 82,000/- විය.

ආ) නැවත විකිණීම සඳහා රුපියල් 25,000/- ක ලිපි ද්‍රව්‍ය ණය පදනම මත මිලදී ගන්නා ලදී.

ඇ) පොලී ආදායම රුපියල් 12,000/- ව්‍යාපාරයේ බැංකු ගිණුමට ලැබිණි.

# 2020 ජනවාරි ප්‍රශ්න අංක 1.15

රෝමා ව්‍යාපාරයේ හි 2019 මාර්තු මාසය තුළ සිදු වූ පහත එක් එක් ගනුදෙනු සඳහා නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න:

A. ව්‍යාපාරය නවීකරණය කිරීමට බැංකුවකින් රුපියල් ලක්ෂ පහක ණයක් ලබාගෙන ඇත.

B. 25,000/- ක පොලී ආදායම බැංකු ගිණුමට ලැබිණි.

C. ව්‍යාපාරයේ රුපියල් 15,000/- ක විදුලි බිලක් හිමිකරු විසින් ඔහුගේ පුද්ගලික මුදලින් ගෙවා ඇත.



# 2020 ජූලි ප්‍රශ්න අංක 1.5

ව්‍යාපාරයේ සේවකයකු වන සුදත්ට සේවක ණය මුදලක් ලබා දී ඇත. මෙම ගනුදෙනුව වාර්තා කිරීම සඳහා නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න:

(1) මුදල් ගිණුම හර සහ කාර්ය මණ්ඩල ණය ගිණුම බැර .
(2) මුදල් ගිණුම හර සහ වැටුප් ගිණුම බැර.
(3) වැටුප් ගිණුම හර සහ කාර්ය මණ්ඩල ණය ගිණුම බැර.
(4) කාර්ය මණ්ඩල ණය ගිණුම හර සහ මුදල් ගිණුම බැර.



JMC vLearning "your virtual learning partner"

# 2021 ජනවාරි ප්‍රශ්න අංක 1.10

තනි පුද්ගල ව්‍යාපාරයක හිමිකරු වන රණසිංහ ඔහුගේ පුද්ගලික මෝටර් රථය ඔහුගේ ව්‍යාපාරයට මාරු කළේය. මෙම ගනුදෙනුව වාර්තා කිරීම සඳහා නිවැරදි ද්විත්ව ද්විත්ව සටහන සඳහන් කරන්න:

(1) මුදල් ගිණුම හර සහ ප්‍රාග්ධන ගිණුම බැර.
(2) මෝටර් වාහන ගිණුම හර සහ මුදල් ගිණුම බැර.
(3) මෝටර් වාහන ගිණුම හර සහ ප්‍රාග්ධන ගිණුම බැර.
(4) ප්‍රාග්ධන ගිණුම හර සහ මෝටර් වාහන ගිණුම බැර.



JMC vLearning "your virtual learning partner"

# 2022 ජූලි ප්‍රශ්න අංක 1.5

රන්සි ට්‍රේඩර්ස් ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා බැංකු ණයක් ලබා ගත්තේය. මෙම ගනුදෙනුව වාර්තා කිරීම සඳහා නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න:

(1) බැංකු ණය ගිණුම හර සහ මුදල් ගිණුම බැර.
(2) බැංකු ණය ගිණුම හර සහ ප්‍රාග්ධන ගිණුම බැර.
(3) මුදල් ගිණුම හර සහ බැංකු ණය ගිණුම බැර.
(4) මුදල් ගිණුම හර සහ ප්‍රාග්ධන ගිණුම බැර.

# 2023 ජනවාරි ප්‍රශ්න අංක 1.10

ඉසංකා සිය ව්‍යාපාරය පුළුල් කිරීමට ලබාගත් බැංකු ණය මුදලේ ප්‍රාග්ධන ගෙවීම ලෙස රුපියල් 1,750,000/- ක් ගෙවා ඇත.
ඇයගේ ව්‍යාපාරයේ ලෙජර් ගිණුම්වල මෙම ගනුදෙනුව වාර්තා කිරීමේ නිවැරදි ද්විත්ව සටහන වනුයේ:

(1) බැංකු ගිණුම හර සහ බැංකු ණය ගිණුම බැර.
(2) බැංකු ණය ගිණුම හර සහ බැංකු ගිණුම බැර.
(3) බැංකු ගිණුම හර සහ ප්‍රාග්ධන ගිණුම බැර.
(4) බැංකු ණය ගිණුම හර සහ ප්‍රාග්ධන ගිණුම බැර.



JMC vLearning "your virtual learning partner"

# 2019 ජනවාරි ප්‍රශ්න අංක 1.15

රසීන් ව්‍යාපාරයේහි තනි හිමිකරු රසීන් වේ. රසීන් ව්‍යාපාරයේ හි පහත එක් එක් ගනුදෙනු සඳහා නිවැරදි ද්විත්ව ද්විත්ව සටහන සඳහන් කරන්න:

a) 95,500/- කට මුදලින් නැවත විකිණීම සඳහා භාණ්ඩ මිලදී ගැනීම.

b) රසීන් තම පුතාගේ උපකාරක ගාස්තුව රුපියල් 24,000/- මුදලින් ව්‍යාපාරයෙන් ගෙවා ඇත

c) රසීන් රුපියල් 1,000,000/- ක් වටිනා ඉඩමක් ව්‍යාපාරයේ අමතර ප්‍රාග්ධනය සඳහා යොදවන ලදී



# ගිණුම්කරණ සංකල්ප



JMC vLearning
your virtual learning partner

## මොනවද මේ ගිණුම්කරණ සංකල්ප කියන්නේ?

- ව්‍යාපාරයක ගණුදෙනු සහ සිදුවීම් වාර්තා කරද්දි පදනම් කරගන්නා විවිධ සංකල්ප න්‍යායන්, පදනම්, උපකල්පන ගිණුම්කරණ සංකල්ප ලෙස හඳුනාගත හැකිය
- මෙම ගිණුම්කරණ සංකල්ප සඳහා විශ්වීය පිළිගැනීමක් තිබෙන අතර, ඒ හේතුවෙන් සියළුම ගිණුම් වාර්තා තුල ඒකීය බවක් සහ සංගත බවක් පවත්වාගත හැකිය
- ගිණුම්කරණයේ පදනම බඳු මෙම ගිණුම්කරණ සංකල්ප 14ක් තිබෙන අතර ඔබ ඒ පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම අනිවාර්ය වේ .







JMC vLearning "your virtual learning partner"

# ව්‍යාපාර ඒකක සංකල්පය

**ව්‍යාපාරය** ↔ **අයිතිකරුවන්**




**ව්‍යාපාරය එහි අයිතිකරුවාගෙන් වෙන් වූ ස්වාධීන ඒකකයකි.**





JMC vLearning "your virtual learning partner"

# ව්‍යාපාර ඒකක සංකල්පය

## උදාහරණ

1. ව්‍යාපාරය, එහි අයිතිකරුවා ව්‍යාපාරයට ආයෝජනය කළ මුදල අභ්‍යන්තර වගකීමක් සේ සලකයි.
2. අයිතිකරුවා කරන ගැනිලි වියදමක් ලෙස නොව අයිතිකරුට ගෙවීමට ඇති බැඳීම් අඩුවීමක් ලෙස දක්වයි.
3. අයිතිකරුගේ පුද්ගලික ගණුදෙනු ව්‍යාපාරය තුල වාර්තා නොකරයි.
4. මූල්‍ය වාර්තා නම් කරන්නේ ව්‍යාපාරයේ නමින් මිස අයිතිකරුගේ නමින් නොවේ.
5. අයිතිකරු සහ ව්‍යාපාරය සමග ඇති ගණුදෙනු පෙන්වීමට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය භාවිතා කරයි.

# මූල්‍ය මිණුම් සංකල්පය





# මූල්‍ය මිණුම් සංකල්පය



**මුදලින් මැනිය හැකි ගණුදෙනු සහ සිදුවීම් පමණක් ගිණුම්ගත කළ හැකිය**

JMC vLC "your virtual learning

# මුදලින් මැනිය නොහැකි පහත දෑ ගිණුම් නොතබයි.



- පාරිභෝගික විශ්වාසය
- සේවක භක්තිය
- සේවක දක්ෂතා
- ආචාර ධර්ම

JMC Jayasekera Management Centre (Pvt) Ltd

JMC vLearning
your virtual learning partner

# මූල්‍ය මිණුම් සංකල්පය

## උදාහරණ

- සියලුම මූල්‍ය ප්‍රකාශනවල මුදල් (රුපියල්) සඳහන් වේ
- ව්‍යාපාරයට වැදගත් වුවත් මුදලින් මැනිය නොහැකි පහත අයිතම ගිණුම්ගත නොකරයි
  - පාරිභෝගික පක්ෂපාතිත්වය
  - සේවක පක්ෂපාතිත්වය
  - සේවක දක්ෂතා

# අඛණ්ඩ පැවැත්ම සංකල්පය






JMC vLearning
"your virtual learning partner"

## අඛණ්ඩ පැවැත්ම සංකල්පය



ව්‍යාපාරයක් දක්නා අනාගත කාලයක් දක්වා පවත්වාගෙන යනු ලබයි යන උපකල්පනය මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබයි

# අඛණ්ඩ පැවැත්ම සංකල්පය

ව්‍යාපාරයක් දක්නා අනාගත කාලයක් දක්වා පවත්වාගෙන යනු ලබයි යන උපකල්පනය මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබයි. ව්‍යාපාරයක් වසා දැමීමක් හෝ ප්‍රමාණාත්මක කප්පාදු කිරීමක් නොකරන බව මෙහිදී උපකල්පනය කෙරේ.

යම් ව්‍යාපාරයක් වසා දැමීමට හෝ මෙහෙයුම් කටයුතු ප්‍රමාණාත්මක කප්පාදු කිරීමට අදහස් කරනවා නම් අඛණ්ඩ පැවැත්ම උපකල්පනයට ගිණුම් තැබිය නොහැක. අඛණ්ඩ පැවැත්ම පදනම වෙනුවට ද්‍රවශීලතා පදනම භාවිතා කර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ හැකිය




# අඛණ්ඩ පැවැත්ම සංකල්පය

## උදාහරණ

- වත්කම් සහ වගකීම් ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීම.
- වගකීම් ශුද්ධ උපලබ්ධි අගයට නොව පිරිවැයට පෙන්නුම් කිරීම.
- දේපළ, පිරියත, උපකරණ ක්ෂය කිරීම.

**THE LANKA HOSPITALS CORPORATION PLC**
Provisional Consolidated Financial Statements for the Quarter ended 31st March 2019

| Statement of Financial Position<br>*As at,* | Group<br>*31st March 2019*<br>Rs. | <br>*31st Dec 2018 Audited*<br>Rs. |
|---|---|---|
| **ASSETS** | | |
| **Non Current Assets** | | |
| Property, Plant & Equipment | **4,442,074,257** | 4,489,065,687 |
| Intangible Assets | **88,416,497** | 93,890,734 |
| Investment Property | - | - |
| Advance Lease Premium | **220,497,844** | 217,032,083 |
| Investment in Subsidiary | - | - |
| **Total Non Current Assets** | **4,750,988,598** | **4,799,988,504** |
| **Current Assets** | | |
| Inventories | **394,346,224** | 369,185,426 |
| Trade & Other Receivables | **807,600,575** | 725,848,269 |
| Amounts due from Related Parties | **4,296,824** | 5,022,039 |
| Economic Service Charge Recoverable | **9,241,569** | 256,632 |
| Other Financial Assets | **2,875,548,849** | 2,673,761,224 |
| Cash and Cash Equivalents | **296,124,512** | 375,496,168 |
| **Total Current Assets** | **4,387,158,554** | **4,149,569,758** |
| **Total Assets** | **9,138,147,152** | **8,949,558,262** |



# ගිණුම්කරණ කාලච්ඡේද සංකල්පය



JMC vLearning
"your virtual learning partner"

# ගිණුම්කරණ කාලච්ඡේද සංකල්පය

**නිශ්චිත කාලපරිච්ඡේදයක් (මූල්‍ය වර්ෂයක්) සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබයි**






# ගිණුම්කරණ කාලච්ඡේද සංකල්පය

## උදාහරණ

- ලාභ හෝ අලාභ ප්‍රකාශයේ මූල්‍ය වර්ෂය සඳහන් කිරීම.
- මූල්‍ය තත්ත්වය ප්‍රකාශය මත වාර්තා කරන දිනය සඳහන් කිරීම.
- ලාභ හෝ අලාභ ප්‍රකාශයේ එම වර්ෂය සඳහා ආදායම සහ වියදම් සලකා බැලීම.

JMC vLearning
your virtual learning partner

# STATEMENT OF PROFIT OR LOSS AND OTHER COMPREHENSIVE INCOME

| For the year ended 31st March | Notes | COMPANY 2024 Rs.'000 | COMPANY 2023 Rs.'000 | GROUP 2024 Rs.'000 | GROUP 2023 Rs.'000 |
|---|---|---|---|---|---|
| **Continuing operations** | | | | | |
| Revenue | 6 | 18,860,317 | 15,435,671 | 76,424,242 | 68,274,718 |
| Cost of sales | | (13,364,686) | (9,816,953) | (55,706,039) | (43,781,973) |
| **Gross profit** | | 5,495,631 | 5,618,718 | 20,718,203 | 24,492,745 |
| Other income | 7 | 2,637,426 | 869,880 | 296,035 | 601,428 |
| Distribution expenses | | (2,327,995) | (1,879,817) | (6,219,413) | (4,938,863) |
| Impairment loss on trade receivables | | (87,459) | (54,613) | (11,952) | (112,042) |
| Administrative expenses | | (1,001,377) | (755,151) | (3,987,189) | (3,133,090) |
| Other expenses | 8 | (153,742) | (55,000) | (122,031) | (67,092) |
| **Results from operating activities** | | 4,562,484 | 3,744,017 | 10,673,653 | 16,843,086 |
| Finance income | | 208,086 | 241,389 | 737,328 | 577,315 |
| Finance cost | | (2,294,261) | (1,832,633) | (3,337,784) | (4,893,844) |
| Finance cost (net) | 9 | (2,086,175) | (1,591,244) | (2,600,456) | (4,316,529) |
| Gain on bargain purchase | 23.1 | - | - | 5,355,562 | - |




JMC vLearning
"your virtual learning partner"

# ද්විත්ව බලපෑම් සංකල්පය

**සෑම ගණුදෙනුවකම ද්විත්ව බලපෑමක් තිබෙන අතර එය හර සහ බැර ලෙස ලෙජරය තුල වාර්තා කෙරේ**






# උදාහරණ

| | | |
|---|---|---|
| ව්‍යාපාරයට මුදල් ආයෝජනය කල විට | මුදල් ↑ | ප්‍රාග්ධනය ↑ |
| රථයක් ණයට මිලදී ගත්විට | රථය ↑ | ණය ↑ |
| ණයට විකුණුම් | ණයගැති ↑ | විකුණුම් ↑ |
| සේවක වැටුප් ගෙවීම් | මුදල් ↓ | වැටුප් ↑ |
| අත්පිට මිලදී ගැනුම් | මුදල් ↓ | ගැණුම් ↑ |

JMC vLearning "your virtual learning partner"

## ද්විත්ව සටහන් න්‍යාය සහ විස්තරාත්මක ගිණුම්කරණ සමීකරණය

| | | |
|---|---|---|
| හර | = | බැර |

වත්කම් + වියදම් = හිමිකම් + ආදායම + වගකීම

ගනුදෙනුවක ද්විත්ව බලපෑම හර සහ බැර ලෙස වාර්තා කරන නිසා සෑම විටම ගණිතමය නිවරද්‍යතාවය පවතී

JMC Jayasekera Management Centre (Pvt) Ltd

## ද්විත්ව බලපෑම් සංකල්පය

### උදාහරණ

- හර සහ බැර ලෙස සටහන් කර ඇති ගනුදෙනු
  - අයිතිකරු මුදල් ආයෝජනය කළේය
    මුදල් හර
    ප්‍රාග්ධනය බැර
  - බැංකු ණය ලබා ගත්තා
    මුදල් හර
    ණය බැර

JMC vLearning your virtual learning partner

# සංගතබවේ/අනුරූපිතා සංකල්පය



JMC Jayasekera Management Centre (Pvt) Ltd

# සංගතබවේ/අනුරූපිතා සංකල්පය

**මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී යොදාගන්නා ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ පදනම්, ගිණුම්කරණ මූලධර්ම නිතර වෙනස් නොකර සංගතව පවත්වාගත යුතුය**

JMC Jayasekera Management Centre (Pvt) Ltd

JMC vLearning
"your virtual learning partner"

# සංගතබවේ/අනුරූපිතා සංකල්පය

## උදාහරණ

- එකම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් භාවිතා කිරීම.
- ගිණුම්කරණ මූලධර්මවල වෙනස්කම් සිදු කරනු ලබන්නේ ගිණුම්කරණ ප්‍රමිතයකට අවශ්‍ය නම් හෝ වෙනස් කිරීම තුලින් වඩාත් විශ්වාසදායක සහ අදාළ තොරතුරු සැපයිය හැකි නම් පමණි



# උපචිත සංකල්පය

JMC vLearning
your virtual learning partner
JMC Jayasekera Management Centre (Pvt) Ltd

# උපචිත සංකල්පය



යම් ගනුදෙනුවකට අදාළ මුදල ලැබෙන හෝ ගෙවන අවස්ථාව තෙක් නොසිට, ගනුදෙනුව සිදු වූ අවස්ථාවේදීම එය හඳුනාගත යුතුය



JMC vLearning
"your virtual learning partner"

# උපචිත සංකල්පය නිසාම හඳුනාගන්නා දේවල්











| | | | |
|---|---|---|---|
| ණයගැතියෝ | ණයහිමියෝ | උපචිත වියදම්<br>උපචිත ආදායම් | පෙර කළ වියදම්<br>ලද අත්තිකාරම් |

# උපචිත සංකල්පය

## උදාහරණ

- හඳුනාගන්නා දේවල්
  - ණයගැතියෝ
  - ණයහිමියෝ
  - උපචිත විදයම්
  - ලැබිය යුතු ආදායම්
  - පෙර කළ වියදම්
  - ලද අත්තිකාරම්

JMC vLearning
"your virtual learning partner"




JMC Jayasekera Management Centre (Pvt) Ltd

## ප්‍රමාණාත්මකභාවය පිළිබඳ සංකල්පය

තොරතුරක අත්හැරීමක් හෝ දුර්නිරූපණයක් මත තීරණ ගන්නා පාර්ශවයකගේ තීරණයකට බලපෑමක් එල්ල වේ නම්, එම තොරතුර ප්‍රමාණාත්මක වේ.

ප්‍රමාණාත්මකභාවය තොරතුරේ ස්වභාවය සහ ප්‍රමාණය මත තීරණය වේ.

## ප්‍රමාණාත්මකභාවය පිළිබඳ සංකල්පය

### උදාහරණ

- විකුණුම්, බැංකු ණය, තොගය වැනි වැදගත් ප්‍රමාණාත්මක තොරතුරු වෙනම මූල්‍ය වාර්තා තුල පෙන්විය යුතුය.
- වසරකට වඩා භාවිතා කළ හැකි වුවත් කුඩා උපකරණ වත්කමක් ලෙස ගිණුම්ගත නොකර වියදමක් සේ හඳුනාගනී
- අධ්‍යක්ෂකවරුන්ට දුන් ණය කොතරම් කුඩා වුවද හෙළිදරව් කළ යුතුය.

JMC vLearning "your virtual learning partner"


ඓතිහාසික පිරිවැය
සංකල්පය


ඓතිහාසික පිරිවැය
සංකල්පය
වත්කම් එහි ඓතිහාසික
පිරිවැයට අගය කළ කර
පවත්වාගත හැකිය
වත්කම්වල වර්තමාන වටිනාකම නිරූපණය නොවීම මෙම සංකල්පයේ දුර්වලතාවයක්
ලෙස හඳුනාගත හැකිය

# ඓතිහාසික පිරිවැය සංකල්පය

## මූලික පිරිවැය

- ගැණුම් පිරිවැය
- මූලික සෘජු පිරිවැය
- සෘජු බදු

## පසුකාලීන ගැලපුම්

- ක්ෂය
- හානිකරණය
- පසුකාලීන ප්‍රාග්ධන වියදම්



JMC vLearning
your virtual learning partner

# ඓතිහාසික පිරිවැය සංකල්පය

## උදාහරණ

- දේපල පිරියත උපකරණ පිරිවැයට මිනුම් කිරීම
- තොගය පිරිවැයට මිනුම් කිරීම

## ඓතිහාසික පිරිවැයට ගිණුම් නොතබන අවස්ථා

1 දේපළ පිරියත උපකරණ ප්‍රත්‍යාගණනය

2 තොග ශුද්ධ උපලබ්ධි අගයට අගය කිරීම

3 මූල්‍ය වත්කම් වෙළඳපොළ වටිනාකමට අගය කිරීම



# උපලබ්ධි සංකල්පය

JMC Jayasekera Management Centre (Pvt) Ltd

JMC vLearning
"your virtual learning partner"

# උපලබ්ධි සංකල්පය



ව්‍යාපාරයක් විසින් භාණ්ඩ හා සේවා විකිණීමෙන් ලද ආදායම මුදල් ලැබීමට ඇති අයිතිය තහවුරු වූ පසු පමණක් හඳුනාගත යුතුය.
එනම් ආදායමක් හඳුනාගත යුත්තේ එම ආදායම උපලබ්ධි වීමෙන් පසුව යන්නයි.

JMC Jayasekera Management Centre (Pvt) Ltd

# උපලබ්ධි සංකල්පය සඳහා උදාහරණ

- භාණ්ඩ විකිණීමක මුදල් ලැබීමට ඇති අයිතිය තහවුරු වන්නේ පාරිභෝගිකයා භාණ්ඩ පිළිගත් පසු වන අතර ඒ මොහොතේදී ආදායම හඳුනාගත හැකිය. භාණ්ඩ සදහා ඇණවුමක් ලද පමණින් විකුණුම් ආදායම හඳුනාගත නොහැක.
- සේවා ආදායමක මුදල් ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු වන්නේ සේවාව ලබාදෙන විටය. ඊට පෙර සේවා ආදායම හඳුනාගත නොහැක.






JMC vLearning your virtual learning partner

# ආදායම උපලබ්ධි වන මොහොත සඳහන් කරන්න.

| | |
|---|---|
| 1. මාලයක් සෑදීමට ඇණවුමක් 1/1/X1 දින රාජා ජුවලර්ස් වෙත ලැබුණි. එම අදාල මුදල පාරිභෝගිකයා 5/1/X1 දින ගෙවූ අතර පාරිභෝගිකයා 6/1/X1 දින මාලය භාරගන්නා ලදී. | |
| 2. කැළණි කේබල් ආයතනයට රු. 500,000 ක කේබල් මිලදී ගැනීමට ඇණවුමක් 5/3/X1 දින ලැබුණි. එදිනම පාරිභෝගිකයා මුළු මුදලම ලබා දෙන ලදී. 31/3/X2 රු. 200,000 ක කේබල් පාරිභෝගිකයා වෙත ප්‍රවාහනය කළ අතර මූල්‍ය වර්ෂය 31/3 න් අවසන් වේ. | |

## ආදායම උපලබ්ධි වන මොහොත සඳහන් කරන්න.

3. ලීටෝ උපදේශක සේවා ආයතනය මාස 06 ක උපදේශන සේවා ව්‍යාපෘතියක් භාරගත් අතර මාස 06 ක කාලය සඳහා රු. 600,000 ක මුදල 1/1/X5 වන දින ගෙවා ඇත. එදින සිට උපදේශන සේවාව මාස 6 කට සපයයි. මූල්‍ය වර්ෂය 31/3 න් අවසන් වේ.



JMC vLearning your virtual learning partner

# උපලබ්ධි සංකල්පය

## උදාහරණ

- භාණ්ඩ විකුණුම් ආදායම් පාරිභෝගිකයා භාණ්ඩ භාරගත් පසු හෝ පිළිගත් පසු හඳුනාගැනීම
- පාරිභෝගිකයාගෙන් ඇණවුම කරන මොහොතේ ලද මුදල පාරිභෝගිකයාගෙන් ලද අත්තිකාරම් ලෙස ජංගම වගකීමක් ලෙස දැක්වීම. භාණ්ඩ සැපයූ පසු එම මුදල ජංගම වගකීම්වලින් ඉවත් කර විකුණුම් ලෙස හඳුනාගැනීම
- සේවා ආදායම සේවාව ලබා දෙන කාලය පුරාවට හඳුනාගැනීම

# ගැලපුම් සංකල්පය



JMC Jayasekera Management Centre (Pvt) Ltd

JMC vLearning "your virtual learning partner"

# ගැලපුම් සංකල්පය

යම් කාලච්ඡේදයක ලාභය ගණනය කිරීමේදී කාලච්ඡේදයට අදාළ ආදායම සහ එම ආදායම ගෙන ඒමට දැරූ එම කාලච්ඡේදයට අදාළ වියදම සමග සන්සන්දනය කළ යුතුය

JMC Jayasekera Management Centre (Pvt) Ltd

# ගැලපුම් සංකල්පයට උදාහරණ



දේපළ පිරියත
උපකරණ ක්ෂය




ප්‍රසාද දීමනා වියදම




ප්‍රතිශ්‍රැතාභාර වියදම

JMC Jayasekera Management Centre (Pvt) Ltd

# ගැලපුම් සංකල්පය

## උදාහරණ

- දේපල, පිරියත හා උපකරණ ක්ෂය වීම.
- බොල් ණය කපා හැරීම සහ අඩමාන ණය වියදම
- අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය නොකරන වත්කම් කපා හැරීම (හානි වූ බඩු තොග)
- විකුණුම් ආදායම හා විකුණුම් පිරිවැය සසඳා දළ ලාභය ගණනය කිරීම
- ලාභයෙන් ගෙවන ප්‍රසාද දීමනාව, එම ලාභයට එරෙහිව හඳුනාගැනීම
- විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී ආරම්භක තොගය එකතු කිරීම සහ අවසාන තොගය අඩු කිරීම
- ප්‍රතිශ්‍රැතාභාර වියදම විකුණුම සිදුවන වර්ෂයේම හඳුනාගැනීම

JMC vLearning "your virtual learning partner"

# විචක්ෂණබවේ සංකල්පය



JMC Jayasekera Management Centre (Pvt) Ltd

JMC vLearning
your virtual learning partner



## විචක්ෂණබවේ සංකල්පය

මූල්‍ය ප්‍රකාශ තුල අතිශයෝක්තියක් නොපෙන්විය යුතුය.
ආදායම් සහ වත්කම් අධිතක්සේරු නොකළ යුතු අතර, වියදම් සහ වගකීම් අවතක්සේරු නොකළ යුතුය.

JMC Jayasekera Management Centre (Pvt) Ltd




# විචක්ෂණ සංකල්පයට උදාහරණ



ණයගැතියන්ට එරෙහි අඩමාන ණය ප්‍රතිපාදන



හානිකරණ අලාභ හඳුනාගැනීම (වටිනාකම පහත වැටීම)



යල් පැන ගිය බඩු තොගයට එරෙහි ප්‍රතිපාදන හඳුනා ගැනීම

JMC vLearning "your virtual learning partner"

# විචක්ෂණබවේ/ආරක්ෂණවාදී සංකල්පය

## උදාහරණ

- ණයගැති අඩමාණ ණය වෙන් කිරීම
- හානි වූ තොග සඳහා වෙන් කිරීම
- දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂය වෙන් කිරීම
- සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීම
- ප්‍රතිඥාභාර සඳහා වෙන් කිරීම
- වත්කම් හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම
- තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කිරීම

JMC vLearning
"your virtual learning partner"



# යථානුරූපීබවේ සංකල්පය

ගිණුම්කරණයේදී නෛතික යථාර්ථයට වඩා ආර්ථික යථාර්ථය වැදගත් වේ

ආර්ථික යථාර්ථය > නෛතික යථාර්ථය



# යථානුරූපීබවේ සංකල්පයට උදාහරණ



කල්බදු පදනමට ගන්නා වත්කම් හඳුනාගැනීම




සාධයකරණය කල ණයගැතියන් හඳුනාගැනීම




විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත යැවූ තොග හඳුනාගැනීම



JMC vLearning
"your virtual learning partner"

# යථානුරූපීබවේ සංකල්පය

## උදාහරණ

- නීත්‍යානුකූල හිමිකරු නොවුවත් කල් බද්දට ලබා ගෙන ඇති වත්කමක් කල්බදු ගැනුම්කරු විසින් සිය මූල්‍ය ප්‍රකාශ තුල හඳුනාගැනීම.
- විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද එහෙත් තවමත් නොවිකිණී ඇති හෝ ආපසු එවීමේ කාලය නොඉක්මවුණු තොග ව්‍යාපාරයේ තොගයක් ලෙස හඳුනාගැනීම
- ලාභයෙන් ප්‍රසාද දීමනා ගෙවීමට නීතිමය අවශ්‍යතාවයක් නැතත්, කාලයක් තිස්සේ ගෙවාගෙන එන බැවින් ප්‍රසාද දීමනා වගකීම හඳුනාගැනීම
- සාධ්‍යකරණය කළ ණයගැතියන්ගේ බොල්ණය අවදානම ව්‍යාපාරය භාරගනී නම් ව්‍යාපාරයේ ණයගැතියන් ලෙසම හඳුනාගැනීම

JMC vLearning
"your virtual learning partner"

# අනාවරණ සංකල්පය



# අනාවරණ සංකල්පය

තීරණ ගන්නා පාර්ශවයන්ට වැදගත්වන සියළු තොරතුරු හෙළිදරව් කළ යුතුය.

JMC Jayasekera Management Centre (Pvt) Ltd

# අනාවරණ සංකල්පය

## උදාහරණ

- දේපළ පිරියත උපකරණ සටහන
- වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් හෙළිදරව් කිරීම.
- මූල්‍ය ප්‍රකාශ මුහුණතේ නැති වෙනත් වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම.
- අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම.

JMC vLearning "your virtual learning partner"




## ප්‍රශ්න අංක 1 - 2018 ජනවාරි ප්‍රශ්න 1.2

යම්කිසි ගිණුම්කරණ කාලපරිච්ඡේදයකදී දරණ ලද වියදම්, ඒවා සඳහා සත්‍ය ලෙස ගෙවීම් නොසලකනමින්, එම ගිණුම්කරණ කාලපරිච්ඡේදය සඳහා සැලකිල්ලට ගත යුතුය. මෙසේ සැලකීම සඳහා අදාල වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1) උපචිත (Accrual) සංකල්පයයි.
2) සංගතතා (Consistency) සංකල්පයයි.
3) අස්තිත්ව (Entity) සංකල්පයයි.
4) ඓතිහාසික පිරිවැය (Historical Cost) සංකල්පයයි.

ලකුණු 02

# ප්‍රශ්න අංක 2 - 2018 ජනවාරි ප්‍රශ්න 1.9

අඛණ්ඩ පැවැත්ම සංකල්පය, කෙටියෙන් පැහැදිලි කරන්න

ලකුණු 02



JMC vLearning your virtual learning partner"

# ප්‍රශ්න අංක 3 - 2018 ජූලි ප්‍රශ්න 1.3

ඒකපුද්ගල ව්‍යාපාරයක අයිතිකරුවෙකු වන පෙරේරා, ඔහුගේ පෞද්ගලික වියදම් සඳහා රු. 5,000/- ක මුදලක් ඔහුගේ ව්‍යාපාරයෙන් ලබාගෙන ඇත අතර, එය ව්‍යාපාරයේ ගැනිලි වශයෙන් සලකා ඇත. මෙසේ සැලකීමට අදාලවන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1) අස්තිත්ව (Entity) සංකල්පයයි.
2) උපචිත (accrual) සංකල්පයයි.
3) උපලබ්ධි (realization) සංකල්පයයි.
4) සංගතතා (Consistency) සංකල්පයයි.

ලකුණු 02

## ප්‍රශ්න අංක 4 - 2018 ජූලි ප්‍රශ්න 1.12

පහත සදහන් එක් එක් අවස්ථාව සදහා අදාල වන ගිණුම්කරණ සංකල්පය සදහන් කරන්න.

1 විසුරුවා හැරීමේ තත්ත්වයට පත්වනතුරු අස්තිත්වය දිගුකාලයක් පවතින බව උපකල්පනය කරයි.

2 ආදායම මුදලින් ලැබුණේද නැද්ද යන්න නොසලකා අදාල ගිණුම්කරණ කාලපරිච්ඡේදයේදී හදුනා ගනු ලබයි.

3 අස්තිත්වය විසින් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති වර්ෂයක් පුරා ඒකාකාරීව ප්‍රතිපත්ති අනුගමනය කළ යුතුය.

ලකුණු 03



## ප්‍රශ්න අංක 5 - 2019 ජනවාරි ප්‍රශ්න 1.2

අස්තිත්නවයක් විසින් අනුගමනය කරනු ලබන ක්ෂය ක්‍රමය පිළිබද ගිණුම්කරණ ප්‍රතිපත්තිය වසරින් වසර වෙනස් නොකළ යුතු වේ. මෙසේ සැලකීමට අදාල වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1) අඛණ්ඩ පැවැත්ම (Going Concern) සංකල්පයයි.
2) අස්තිත්ව (Entity) සංකල්පයයි.
3) සංගතතා (Consistency) සංකල්පයයි.
4) උපලබ්ධි (Realization) සංකල්පයයි.

ලකුණු 02



JMC vLearning your virtual learning partner

# ප්‍රශ්න අංක 6 - 2019 ජනවාරි ප්‍රශ්න 1.12

පහත සදහන් එක් එක් ගණුදෙනු සදහා අදාලවන ගිණුම්කරණ සංකල්පය හදුනා දක්වන්න.

1 නිශ්චිත ගිණුම්කරණ කාලපරිච්ඡේදයකදී දරණ ලද වියදම්, සත්‍ය වශයෙන් ගෙවීම් කලේද යන්න නොසලකා සැළකිල්ලට ගත යුතුය.

2 ව්‍යාපාරයේ ඉඩමක්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගැණුම් මිලට (purchase price) පෙන්නුම් කරයි.

3 ණයගැතියන්ගෙන් අඩමාණ ණය සදහා ප්‍රතිපාදනයක් සිදුකල යුතුය.

ලකුණු 03



# ප්‍රශ්න අංක 7 - 2019 ජූලි ප්‍රශ්න 1.3

අස්තිත්වය විසුරුවා හැරීමේ තත්ත්වයට පත්වනතුරු එය දිගුකාලයක් පවතින බව උපකල්පනය කරයි,.

1) ඓතිහාසික පිරිවැය සංකල්පයයි.
2) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.
3) උපලබ්ධි සංකල්පයයි.
4) අස්තිත්ව සංකල්පයයි.

ලකුණු 02

## ප්‍රශ්න අංක 8 - 2019 ජුලි ප්‍රශ්න 1.10

පහත සදහන් එක් එක් ප්‍රකාශය සදහා අදාළවන නිවැරදි ගිණුම්කරණ සංකල්පය හදුනා ගන්න.

1 සමාගමක් විසින් තොග අගය කිරීම සදහා භාවිතා කරන ක්‍රමය ඒකාකාරීව අනුගමනය කළ යුතුයි.

2 සෑම ගණුදෙනුවක්ම මුදලින් වාර්තා කරයි.

3 අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික භාවිතය සදහා ලබාගත් භාණ්ඩ ගැනිලි ලෙස සලකනු ලැබේ.

ලකුණු 03



JMC vLearning "your virtual learning partner"

## ප්‍රශ්න අංක 9 - 2020 ජනවාරි ප්‍රශ්න 1.2

අයභාරය (ආදායම) මුදලින් ලැබුණේද නැද්ද නොසලකා, කිසියම් ගිණුම් කාලපරිච්ඡේදයට අදාල අයභාරය හදුනාගනු ලබයි. මෙයට අදාළවන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1) අඛණ්ඩ පැවැත්ම (Going Concern) සංකල්පයයි.
2) උපචිත (Accrual) සංකල්පයයි.
3) මූල්‍ය මිනුම් (Money Measurement) සංකල්පයයි.
4) අස්තිත්ව (Entity) සංකල්පයයි.

ලකුණු 02

# ප්‍රශ්න අංක 10 - 2020 ජනවාරි ප්‍රශ්න 1.10

ගිණුම්කරණ කාලච්ඡේද සංකල්පය, කෙටියෙන් පැහැදිලි කරන්නි

ලකුණු 02



JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්න අංක 11 - 2020 ජනවාරි ප්‍රශ්න 1.14

පහත සඳහන් එක් එක් ප්‍රකාශය සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න

1 14 ප්‍රමාණාත්මකබවේ සංකල්පයට අනුව, ප්‍රමාණාත්මක අයිතම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම හෙළි කළ යුතුය

01 Marks

## ප්‍රශ්න අංක 12 - 2020 ජනවාරි ප්‍රශ්න 1.3

ව්‍යාපාරය හා අයිතිකරු එකිනෙකින් වෙන් වූ ස්වාධීන අස්තිත්ව දෙකක් සේ සලකා ගනුදෙනු හඳුනාගනී.

පහත සඳහන් ගිණුම්කරණ සංකල්ප අතුරින්, ඉහත සඳහන් ප්‍රකාශනය, පැහැදිලි කරන්නේ කුමන සංකල්පයෙන්ද?

1) අස්තිත්ව (Entity) සංකල්පය
2) අඛණ්ඩ පැවැත්ම (Going Concern) සංකල්පය
3) සංගතතා (Consistency) සංකල්පය
4) ආරක්ෂණ (Prudence) සංකල්පය

ලකුණු 02



JMC vLearning "your virtual learning partner"

## ප්‍රශ්න අංක 13 - 2020 ජූලි ප්‍රශ්න 1.12 හා 1.14

පහත ප්‍රකාශ හරිද වැරදිද දක්වන්න

1.12 ප්‍රමාණාත්මක බවේ සංකල්පයට අනුව තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගය මත වාර්තා කරනු ලබයි. (     )

1.14 උපචිත සංකල්පයට අනුව, කිසියම් ගිණුම්කරණ කාලපරිච්ඡේදයකට අදාල අයභාරය මුදලින් ලැබුණේද නැද්ද යන්න නොසලකා හරිනු ලබයි (     )

ලකුණු 02

# ප්‍රශ්න අංක 14 - 2020 ජූලි ප්‍රශ්න 1.17

සංගතතා (Consistency) සංකල්පය, කෙටියෙන් පැහැදිලි කරන්න

ලකුණු 02



# ප්‍රශ්න අංක 15 - 2021 ජනවාරි ප්‍රශ්න 1.3

පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග අගය කරනු ලැබේ.

ඉහත ප්‍රකාශයට අදාළ වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1) ආරක්ෂණ සංකල්පය
2) අඛණ්ඩ පැවැත්ම සංකල්පය
3) අස්තිත්ව සංකල්පය
4) උපචිත සංකල්පය

ලකුණු 02



JMC vLearning your virtual learning partner"

## ප්‍රශ්න අංක 16 - 2021 ජනවාරි ප්‍රශ්න 1.6

අස්තීත්වයක් විසින් දැකිය හැකි අනාගතයක් දක්වා තම මෙහෙයුම් නොකඩවා කරගෙන යන බව උපකල්පනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි

ඉහත ප්‍රකාශය වඩාත් හොඳින් පැහැදිලි කරන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1) කාලච්ඡේද සංකල්පයයි. 2) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.
3) උපචිත සංකල්පයයි. 4) අස්තීත්ව සංකල්පයයි.

ලකුණු 02



JMC vLearning "your virtual learning partner"

## ප්‍රශ්න අංක 17 - 2021 ජූලි ප්‍රශ්න 1.2

1.2 2021 මාර්තු 31 දිනට, සමනල ට්‍රේඩර්ස්හි 2021 මාර්තු මාසය සඳහා විදුලි වියදම් වශයෙන් රු. 25,000/- ක් වාර්තා කර තිබේ. නමුත් එහි ගෙවීම් කර ඇත්තේ 2021 අප්‍රේල් මාසයෙහිදීය.

ඉහත සඳහන් ප්‍රකාශයට අදාල වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1) අස්තීත්ව සංකල්පයයි. 2) උපචිත සංකල්පයයි.
3) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි. 4) ආරක්ෂණ සංකල්පයයි.

ලකුණු 02

# ප්‍රශ්න අංක 18 - 2021 ජුලි ප්‍රශ්න 1.9

මහනුවර ඇති ඉඩමක් රාමා ට්‍රේඩර්ස් සතුවන අතර, එය රාමා ට්‍රේඩර්ස්හි 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එහි ගැණුම් මිල වන රු. 5,000,000/- ට පෙන්වා තිබේ

නමුත් 2021 මාර්තු 31 දිනට මෙම ඉඩමේ වෙළඳපොල වටිනාකම රු. 6,000,000/- ක් විය. මේ සම්බන්ධයෙන් වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1) සංගතතා සංකල්පයයි.
2) ගැලපුම් සංකල්පයයි.
3) ඓතිහාසික පිරිවැය සංකල්පයයි.
4) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.

ලකුණු 02



JMC vLearning your virtual learning partner

# ප්‍රශ්න අංක 19 - 2021 ජුලි ප්‍රශ්න 1.11

1.11,අස්තිත්ව සංකල්පයට අනුව, ව්‍යාපාරය සහ අයිතිකරුගේ දුරකතන බිල්පත, ව්‍යාපාරය විසින් ගෙවන ලද අතර, එය ව්‍යාපාරයේ ගැනිලි ලෙස සලකා තිබේ,

ඉහත සැලකීමට අදාළවන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

1) උපචිත සංකල්පයයි.
2) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.
3) ගැලපුම් සංකල්පයයි.
4) අස්තිත්ව සංකල්පයයි.

ලකුණු 01

## ප්‍රශ්න අංක 20 - 2022 ජනවාරි ප්‍රශ්න 1.10

අස්තිත්වයක් අපේක්ෂා කල හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් නොකඩවා කරගෙන යන බව උපකල්පනය මත පිහිටා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි,

1) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.
2) උපචිත සංකල්පයයි.
3) අස්තිත්ව සංකල්පයයි.
4) කාලච්ඡේද සංකල්පයයි.

ලකුණු 02



## ප්‍රශ්න අංක 21 - 2022 ජනවාරි ප්‍රශ්න

පහත සදහන් ඒවා අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න

1) ශේෂ පිරික්සුම එකග වන්නේ නම්, ගිණුම් පොත්වල වැරදි තිබිය නොහැකිය.
2) ආරක්ෂණ සංකල්පය අනුව, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත තොග අගය කරනු ලැබේ.
3) පොදු ලෙජරය, මූලික සටහන් පොතකි.
4) බැංකු සැසදුම් ප්‍රකාශනය පිළියෙල කරනු ලබන්නේ ව්‍යාපාර අස්තිත්වයේ බැංකුව විසිනි

ලකුණු 02



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 22 - 2022 ජූලි ප්‍රශ්න 1.12 හා 1.14

1.12 ව්‍යාපාරයක සියලුම ගණුදෙනු සහ සිදුවීම් මුදලින් මැනිය හැකි වුවද, නොහැකි වුවද වාර්තා කිරීම අවශ්‍ය වේ.

1.14 පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය (Net Realizable Value {NRV}) යන දෙකෙන් අඩු අගයට තොග අගය කිරීම, ආරක්ෂණ ගිණුම්කරණ සංකල්පය සඳහා නිදසුනකි.

ලකුණු 02



# ප්‍රශ්න අංක 23 - 2023 ජනවාරි ප්‍රශ්න 1.2

අස්තිත්වයක් විසින් අනුගමනය කරනු ලබන තොග ගණනය කිරීමේ ක්‍රමයට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය කාලච්ඡේද අතරතුරදී වෙනස් නොකළ යුතුය. මේ සම්බන්ධයෙන් වන ගිණුම්කරණ සංකල්පය වන්නේ‍

1) උපචිත සංකල්පයයි.
2) අඛණ්ඩ පැවැත්ම පිළිබද සංකල්පයයි.
3) ඓතිහාසික පිරිවැය සංකල්පයයි.
4) සංගතතා සංකල්පයයි.

ලකුණු 02



JMC vLearning your virtual learning partner

# ප්‍රශ්න අංක 24 - 2023 ජනවාරි ප්‍රශ්න 1.7

**චිරාත්**, ඔහුගේ ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශීර්ෂයේ ,**2022 මාර්තු 31 දිනට,** ලෙස සදහන් කර තිබුණි. ඔහු විසින් අනුගමනය කර තිබෙන වඩාත්ම අදාළ ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1) කාලච්ඡේද සංකල්පය
2) ප්‍රමාණාත්මක සංකල්පය
3) ගැලපුම් සංකල්පහ
4) උපචිත සංකල්පය

ලකුණු 02



# ප්‍රශ්න අංක 25 - 2023 ජනවාරි ප්‍රශ්න 1.15

පහත ප්‍රකාශ හරිද වැරදිද දක්වන්න

ආරක්ෂණ සංකල්පය (prudence concept) අනුව, ව්‍යාපාරය සහ අයිතිකරුවන් වෙන්වූ ස්වාධීන අස්තීත්වයන් දෙකක් ලෙස සලකා ගනුදෙනු හදුනාගනු ලබයි

ලකුණු 01



JMC vLearning your virtual learning partner

# ප්‍රශ්න අංක 26 - 2023 ජූලි ප්‍රශ්න 1.18

යථාරූපී බවේ,[Substance Over Form] ආකෘතියට වඩා හරය හුවා දැක්වීම සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

ලකුණු 02



# ප්‍රශ්න අංක 27 - 2024 ජනවාරි ප්‍රශ්න 1.5

සමන් ට්‍රේඩර්ස් රු. 2,500,000/- කට ඉඩමක් මිලදී ගත් අතර, ඉඩමේ වර්තමාන වෙළඳපොල වටිනාකම රු. 4,000,000/- කි. කෙසේවුවද, මෙම ඉඩම, මූල්‍ය ප්‍රකාශනවල ගැණුම් මිල වූ රු. 2,500,000/- ක් ලෙස පෙන්වා තිබේ. මේ සම්බන්ධයෙන් අදාල වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1) ගැලපුම් සංකල්පයයි.
2) උපචිත සංකල්පයයි.
3) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.
4) ඓතිහාසික පිරිවැය සංකල්පයයි.

ලකුණු 02



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 28 - 2024 ජනවාරි ප්‍රශ්න 1.10

**සීමාසහිත ABC සමාගමේ** ගොඩනැගිල්ලේ කොටසක් මසකට රු. 10,000/- බැගින් කුලියට දී තිබේ. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුලදී, රු. 110,000/- ක මුදල ලැබුණු අතර, ඉතිරි රු. 10,000/- ඊළග මූල්‍ය වර්ෂය තුලදී ලැබුණි. සමාගමේ සහකාර ගණකාධිකාරීවරයා වන විශ්ණු, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සදහා වන කුලී ආදායම වශයෙන් රු. 110,000/- ක් පමණක් හදුනාගෙන තිබුණි.

පහත සදහන් ගිණුම්කරණ සංකල්ප අතුරෙන්, විශ්ණු විසින් උල්ලංඝණය කර තිබෙන්නේ කුමන ගිණුම්කරණ සංකල්පයක් ද?

1) ගැලපුම් සංකල්පයයි. 2) අස්තීත්ව සංකල්පයයි.
3) උපචිත සංකල්පයයි. 4) ප්‍රමාණාත්මකබවේ සංකල්පයයි.

ලකුණු 02



# ප්‍රශ්න අංක 28 - 2024 ජනවාරි ප්‍රශ්න 1.20

ගැලපුම් සංකල්පය, කෙටියෙන් පැහැදිලි කරන්න.

ලකුණු 02



JMC vLearning "your virtual learning partner"




JMC vLearning
“your virtual learning partner”